**LOCOMOTIVE OFFICERS ASSOCIATION**

REG. NO - 10039

+94 71 268 2462

locomotiveofficers@gmail.com

NO 537/H/I, LAKE ROAD,
WEERA VIKUM ROAD,
AKUREGODA,
THALANGAMA SOUTH.


අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.
2026.09.02

**<u>දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගේ අත්තනෝමතික පරිපාලනය හේතුවෙන් දුම්රිය සේවය අර්බුදයට පත්වීම, මගී ජනතාව නිරන්තර අපහසුතාවට පත්වීම හා ඒ පිළිබඳ හඬ නගන වෘත්තීය සමිති නිලධාරීන් මර්දනය කිරීමට එරෙහිව ගනු ලබන ඒකාබද්ධ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් නිල වශයෙන් කරනු ලබන දැනුම්දීම.</u>**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොඳු නාරටිය බඳු ශ්‍රේණියක් වන දුම්රිය එන්ජින් රියදුරුවරුන් නියෝජනය කරන අප  වෘත්තීය සමිතිය, දුම්රිය දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිපාලන තත්ත්වය, වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට සිදු වන බලපෑම් සහ දුම්රිය සේවයේ යහපත් පරිපාලනය සම්බන්ධයෙන් අනෙකුත් දුම්රිය වෘත්තීය සමිති සමඟ ඒකාබද්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව පහත සඳහන් කරුණු දෙක සම්බන්ධයෙන් ඒකාබද්ධ තීරණයකට පැමිණි සිටින බව මින් දැනුම් දෙමු.

මෙම කරුණු දුම්රිය සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම්වලට, සමස්ත දුම්රිය වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ යහපත් පරිපාලනයට බලපාන පොදු කරුණු ලෙස වගකිව යුතු වෘත්තීය සමිතියක් වශයෙන් අප සලකමු.

01. **දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් වෘත්තීය සමිති මර්දනයට දිගින් දිගටම කටයුතු කිරීම.**

ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමයේ ලේකම්වරයා විසින් එම සංගමයේ නිල නියෝජිතයෙකු සහ ප්‍රධාන නිලධාරියෙකු වශයෙන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ වර්තමාන තත්ත්වය, දුම්රිය සේවයේ පවතින ගැටලු, පරිපාලන අඩුපාඩු සහ සංගමයේ සාමාජිකයන්ට බලපාන වෘත්තීය හා සේවාමය ගැටලු සම්බන්ධයෙන් ජනමාධ්‍ය වෙත කරුණු දැක්වීම පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් ඔහුගෙන් නිදහසට කරුණු විමසා ඇති බව අප සංගමයේ අවධානයට ලක්ව ඇත.

වෘත්තීය සමිතියක ලේකම්වරයා යනු එම සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් නිල වශයෙන් පෙනී සිටින ප්‍රධාන නියෝජිතයෙකි. ඒ අනුව, සාමාජිකයන්ට බලපාන වෘත්තීය හා සේවාමය ගැටලු, දෙපාර්තමේන්තු පරිපාලනයේ පවතින අඩුපාඩු, ගනු ලබන තීරණ හා ක්‍රියාමාර්ග මෙන්ම ඒ සම්බන්ධයෙන් සංගමයේ නිල ස්ථාවරය ද ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශ කිරීම සහ මහජනතාව දැනුවත් කිරීම ඔහු වෙත පැවරී ඇති වෘත්තීය සමිති නියෝජන කාර්යභාරයේ අත්‍යවශ්‍ය අංගයක් බව අප සංගමයේ මතයයි.

එබැවින්, එම නිල වගකීම ඉටු කිරීමේ අරමුණින් මාධ්‍ය වෙත කරුණු දැක්වීම වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයෙන් වෙන්කර සැලකිය නොහැකි බව අපගේ ඒකාබද්ධ ස්ථාවරයයි.

සංගමයක නිලධාරියෙකු විසින් තම සංගමයේ සාමාජිකයන්ට බලපාන සේවාමය හා වෘත්තීය කරුණු පිළිබඳව, සංගමයේ නිල වගකීම යටතේ ජනමාධ්‍ය වෙත කරුණු දැක්වීම පමණක් පදනම් කරගෙන

ඔහුට එරෙහිව නිදහසට කරුණු විමසීමක් හෝ පරිපාලන/විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම, වෘත්තීය සමිතිවල නිදහස් නියෝජන කාර්යභාරයට බරපතළ බලපෑමක් ඇති කරන ක්‍රියාවක් බවට පත්විය හැකි බව වගකිවයුතු වෘත්තීය සමිතියක් වශයෙන් අප අවධාරණය කරමු.

මෙය ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමයට පමණක් බලපාන කරුණක් නොව, දුම්රිය දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන සියලුම වෘත්තීය සමිතිවල නිලධාරීන්ට තම සාමාජිකත්වය වෙනුවෙන් අදහස් දැක්වීමට, සේවාමය ගැටලු ඉදිරිපත් කිරීමට සහ මහජනතාව දැනුවත් කිරීමට ඇති හැකියාවට සෘජුව බලපාන පොදු වෘත්තීය සමිති කරුණක් බව අපගේ ඒකාබද්ධ ස්ථාවරයයි.

ඒ අනුව, ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමයේ ලේකම්වරයා විසින් සිය සංගමයේ නිල වගකීම් ඉටුකරමින් දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ එහි සාමාජිකයන්ගේ ගැටලු සම්බන්ධයෙන් ජනමාධ්‍ය වෙත කරුණු දැක්වීම පදනම් කරගෙන ඔහුගෙන් කැඳවා ඇති නිදහසට කරුණු විමසීම වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීමටත්, ඒ මත පදනම් වූ කිසිදු අසාධාරණ විනය හෝ පරිපාලන ක්‍රියාමාර්ගයක් නොගැනීමටත් දුම්රිය වෘත්තීය ස්මිති ඒකාබද්ධව ඉල්ලා සිටිනු ලබන ඉල්ලීමට අප සංගමයේ සහයෝගය පළ කර සිටිනු ලබන බව මින් දැනුම් දෙමි.

**02. වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා වහාම ධුරයෙන් ඉවත් කිරීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ උද්ගතව ඇති පරිපාලන, මෙහෙයුම්, තාක්ෂණික සහ සේවක ගැටලු සම්බන්ධයෙන් වෘත්තීය සමිතියක් වශයෙන් අපගේ දැඩි අවධානය යොමු වී ඇත.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යනු සාමාන්‍ය පරිපාලන ආයතනයක් නොව, මහජන සේවාවක් සපයන සුවිශේෂී ආයතනයකි. එදා මෙදා තුර ඉතිහාසයේ දුම්රිය සේවය යනුවෙන් සේවා වර්ගීකරණය යටතේ දක්වා ඇති දෙපාර්තමේන්තුවක් වන මෙහි එම සේවාවන් නිසි ලෙස සැපයීම සඳහාම සුවිශේෂී වූ න්‍යායාත්මක සහ තාක්ෂණික දැනුම මත පදනම්ව දිනපතා දුම්රිය මෙහෙයුම් කළමනාකරණය කරමින් දුම්රිය දේපළ සහ මගී ආරක්ෂාව උපරිම ලෙස සලසමින් කලට වේලාවට මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීම මත ක්‍රියාත්මක වන ජාතික වැදගත්කමක් ඇති රාජ්‍ය සේවාවකි.

මහජනයාට උපරිම සේවාවක් සැලසීමේ අරමුණ පෙරදැරිව දිනකට දුම්රිය සේවා වාර 450 කට ආසන්න සංඛ්‍යාවක් ධාවනය වුවද වත්මනෙහි දිනකට ක්‍රියාත්මක වන්නේ දුම්රිය සේවා වාර 180 කට ආසන්න ප්‍රමාණයකි. වත්මන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාට පෙර සිටි දුම්රිය සාමාන්‍යාධිකාරීවරයන් විසින් තාක්ෂණික අංශ වලින් අවශ්‍ය තොරතුරු ලබාගෙන, මහජන අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල නිසි ලෙස කළමනාකරණය කරමින් දෙනුවර මැණිකේ, පුලතිසි, ඇල්ල ඔඩිසි සහ සීතාවක ඔඩිසි, කැලිප්සෝ වැනි දුම්රියන් අලුතින් ධාවනයට එක් කරමින් කටයුතු කළද වත්මන් සාමාන්‍යාධිකාරීවරයාගේ පරිපාලනය තුළ එවැන්නක් දක්නට නොමැත.

දිනෙන් දින සිදුවන සේවා වාර කප්පාදුව තුළ සහ කලට වෙලාවට අමතර කොටස් සහ ලිහිසි ද්‍රව්‍ය කළමනාකරණය කර ගනිමින් නිසි ප්‍රසම්පාදනයන්ට යොමු නොවීම මත ධාවන වාර අතර තුර එන්ජින් සහ බලවේග කට්ටල වල සිදු කරනු ලබන නිසි නඩත්තුවක් හෝ නොමැතිව එන්ජින් යන්ත්‍ර එක දිගට ධාවනය කරවීම හේතුවෙන් බොහෝ දුම්රියන් ප්‍රමාද වීම සහ සේවා වාර අතර මග අබලන් වීම සිදුවීමෙන් මගී ජනයා බරපතල ලෙස මහ මග අතරමංව ගමනා ගමන පහසුකම් සලසා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබේ. අවම සේවා වාර සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරවීම මත අධික මගී ගණත්වය නිසි ලෙස කළමනාකරණය කිරීමට නොහැකි වීමෙන් මගී ජනයා දිනෙන් දින දුම්රියෙන් ඇද වැටී මරුමුවට පත් වීම් වාර්තා වෙමින් පවතී.

තත්වය එසේ තිබියදී දුම්රිය අංගන වල නවතා තබා ඇති බලවේග කට්ටල සහ අනෙකුත් එන්ජින් යන්ත්‍ර සහ මැදිරි තුළ ඇති විදුලි රැහැන් සහ අනෙකුත් උපකරණ සොරුන්ගේ ග්‍රහනයන්ට ලක්ව ධාවනය කරවීමට නොහැකි තත්වයන් දිනෙන් දින උද්ගත වෙමින් පවතී. දුම්රිය එන්ජින්, මැදිරි සහ බලවේග කට්ටල වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද දෙපාර්තමේන්තුව තුළ බරපතල අර්බුදයක් පවතින නමුත් අදාළ අංශ සහ උප දෙපාර්තමේන්තු සමග එක්ව විසඳුම් ගැනීමක් අපට දක්නට නොලැබේ.

එබැවින් එහි ප්‍රධාන පරිපාලන නායකත්වය සඳහා දුම්රිය ධාවනය, මෙහෙයුම්, තාක්ෂණික ක්‍රියාකාරිත්වය, ආරක්ෂාව, සේවක කළමනාකරණය සහ දෙපාර්තමේන්තුවේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රමාණවත් දැනුම, අවබෝධය, අත්දැකීම සහ කළමනාකරණ හැකියාව තිබීම අත්‍යවශ්‍ය වේ.

වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගේ පරිපාලනය යටතේ ගනු ලබන තීරණ, දුම්රිය සේවයේ පවතින ගැටලු සඳහා ලබාදෙන ප්‍රතිචාර, සේවක හා වෘත්තීය සමිති ගැටලු කළමනාකරණය කරන ආකාරය සහ දුම්රිය සේවයේ සුවිශේෂී තාක්ෂණික හා මෙහෙයුම් ස්වභාවය පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික අවබෝධය සලකා බැලීමේදී, වර්තමාන නායකත්වය සම්බන්ධයෙන් අප වෘත්තීය සමිතිවල බරපතළ විශ්වාසභංග තත්වයක් ඇති වී ඇත.

දුම්රිය සේවයේ පවතින ගැටලු සඳහා කාලෝචිත හා ප්‍රායෝගික විසඳුම් ලබාදීම, වෘත්තීය සමිති හා සේවකයන් සමඟ සාධනීය සබඳතා පවත්වා ගෙන යාම, ක්ෂේත්‍රයේ තාක්ෂණික හා මෙහෙයුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ප්‍රමුඛතා අනුව ක්‍රියා කිරීම සහ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් වර්තමාන පරිපාලනය පිළිබඳව අපට බරපතළ ගැටලු පවතී. ඒ අනුව, වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගේ පරිපාලනය හා නායකත්වය කෙරෙහි අප ඒකාබද්ධ දුම්රිය වෘත්තීය සමිතිවල විශ්වාසය අහිමි වී ඇති බව පැහැදිලිව ප්‍රකාශ කරමු.

එබැවින් වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා වහාම එම ධුරයෙන් ඉවත් කර, දුම්රිය සේවයේ තාක්ෂණික, මෙහෙයුම් හා පරිපාලන ස්වභාවය පිළිබඳ ප්‍රමාණවත් දැනුම, පළපුරුද්ද, ප්‍රායෝගික අවබෝධය සහ කළමනාකරණ හැකියාව සහිත සුදුසු නිලධාරියෙකු එම ධුරයට පත් කිරීමට රජය සහ ප්‍රවාහන අමාත්‍යාංශය වහාම කටයුතු කළ යුතු බව බහුතර දුම්රිය වෘත්තීය සමිති සමඟ පැවති ඒකාබද්ධ සාකච්ඡාවෙන් අනතුරුව ගනු ලැබූ ඒකාබද්ධ තීරණයට අප සංගමයේ සහයෝගය පළ කර සිටින බව මින් දැනුම් දෙමු.

**අවසන් දැනුම්දීම සහ පැය 48 ක ඒකාබද්ධ වැඩ වර්ජනය.**

ඉහත සඳහන් ඉල්ලීම් දෙක සම්බන්ධයෙන් රජය සහ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කඩිනමින්, පැහැදිලිව සහ පිළිගත හැකි විසඳුමක් ලබාදිය යුතු බව සංගමයක් වශයෙන් අප අවධාරණය කරමු.

ඒ අනුව, ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමයේ ලේකම්වරයාගෙන් කැඳවා ඇති නිදහසට කරුණු විමසීම වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීම; සහ වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා එම ධුරයෙන් වහාම ඉවත් කිරීම,

යන ප්‍රධාන ඉල්ලීම් දෙක සඳහා පිළිගත හැකි හා නිශ්චිත විසඳුමක් ලබා නොදෙන්නේ නම්,

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ වෘත්තීය සමිති විසින් 2026 සැප්තැම්බර් 17 දින පැය 00.00 සිට 2026 සැප්තැම්බර් 18 දින පැය 24.00 දක්වා පැය 48 ක ඒකාබද්ධ වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බවත් ඒ සඳහා අප සංගමයේ පූර්ණ සහයෝගය ලබා දෙනු ලබන බවත් මෙයින් රජයට, ප්‍රවාහන අමාත්‍යාංශයට සහ දුම්රිය පරිපාලනයට පැහැදිලිව හා අවසන් වශයෙන්

දැනුම් දෙමු. මෙම පැය 48 ක වැඩ වර්ජනය, ඉහත සඳහන් ප්‍රධාන ඉල්ලීම් දෙක සම්බන්ධයෙන් සාධාරණ හා පිළිගත හැකි විසඳුමක් ලබා ගැනීම සඳහා ඒකාබද්ධ දුම්රිය වෘත්තීය සමිති විසින් ගනු ලබන පොදු වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් වනු ඇත.

2026 සැප්තැම්බර් 17 දිනට පෙර ඉහත ඉල්ලීම් සඳහා ප්‍රමාණවත්, පැහැදිලි හා පිළිගත හැකි විසඳුමක් ලබා නොදෙන්නේ නම්, නියමිත පරිදි පැය 48ක ඒකාබද්ධ වැඩ වර්ජනය සඳහා අප සංගමයද එක්ව එම වර්ජන ක්‍රියාමාර්ගයට අවතීර්ණ වනු ලබන බව මෙයින් අවසන් වශයෙන් දැනුම් දෙමු. මෙම තීරණය හුදෙක් සාකච්ඡාවක් ඉල්ලා සිටීමක් හෝ අනතුරු ඇඟවීමක් නොව, දුම්රිය වෘත්තීය සමිති අතර පැවති සාකච්ඡාවෙන් අනතුරුව ඒකාබද්ධව ගනු ලැබූ නිශ්චිත වෘත්තීය සමිති තීරණයක් බව ද වගකිවයුතු වෘත්තීය සමිතියක් වශයෙන් අප අවධාරණය කරමු.

ඉහත ඉල්ලීම් සඳහා විසඳුමක් ලබා නොදීම හේතුවෙන් මෙම වෘත්තීය සමිති ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක කිරීමට සිදුවුවහොත්, එයින් දුම්රිය සේවයට හා මහජනතාවට ඇති විය හැකි අපහසුතා වැළැක්වීම සඳහා ඉදිරි කාලය තුළ කඩිනම් විසඳුමකට පැමිණීම අදාළ බලධාරීන්ගේ වගකීම බවද අප අවධාරණය කරමු. ඉහත තීරණ සහ පැය 48 ක ඒකාබද්ධ වැඩ වර්ජන තීරණය සඳහා අප සංගමයේ සම්පූර්ණ එකඟතාව පළ කරනු ලබන බව අවසන් වශයෙන් මින් දැනුම් දෙමු.

මෙයට,

S.R.C.M. SENANAYAKE
Secretary
Locomotive Officer's
Association
Reg No : 10039

එස්. ආර්. සී. එම්. සේනානායක
ප්‍රධාන ලේකම්
ලොකොමෝටිව් ඔෆිසර්ස් ඇසෝසියේෂන්

පිටපත් :

ගරු අග්‍රාමාත්‍ය හරිණි අමරසූරිය මෙනවිය

ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය

අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය කාර්යාලය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යතුමා

ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ලේකම් - ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

දුම්රිය සාමාන්‍යාධිකාරි

අතිරේක සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ගමනාගමන/වාණිජ)

අධිකාරි (ගමනාගමන/වාණිජ)

නියෝජ්‍ය අධිකාරි (ගමනාගමන)- කොළඹ/ අනුරාධපුර/ නාවලපිටිය